// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2441/07 - 2025 ජුනි මස 17 වැනි අඟහරුවාදා - 2025.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 21/78(XVI)(C)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2025 ජුනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

**නියමාවලිය**

2005 ජුනි මස 06 වැනි දින අංක 1396/4 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2005 අංක 01 දරන ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 4 වන ඡේදයේ (ළ) අනුඡේදයේ "කලාගාර, කලායතන හා වෙනත් ගොඩනැගිලි" යන වචන වෙනුවට, "කලාකුටි, කලායතන, මුද්‍රණ මධ්‍යස්ථානයක්, කලාගාරයක් සහ වෙනත් ගොඩනැගිලි" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි 5 වන ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(iii) අධ්‍යයන අංශ;";

(3) එහි 7 වන ඡේදයේ -

(අ) (5) වන අනුඡේදයේ "විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා" යන වචන වෙනුවට, "මණ්ඩලය විසින් නම් කරනු ලබන ආයතනයේ අධ්‍යයන අංශයක ප්‍රධානියා" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (6) වන අනුඡේදයේ "විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා" යන වචන වෙනුවට, "මණ්ඩලය විසින් නම් කරනු ලබන ආයතනයේ අධ්‍යයන අංශයක ප්‍රධානියා" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි 8 වන ඡේදයේ -

(අ) (1) වන අනුඡේදයේ "කළමනාකාර මණ්ඩලයේ " යන වචන වෙනුවට, "මණ්ඩලයේ" යන වචනය ආදේශ කිරීමෙන්;

(ආ) (3) වන අනුඡේදයේ "කළමනාකරණ මණ්ඩලයේ " යන වචන වෙනුවට, "මණ්ඩලයේ" යන වචනය ආදේශ කිරීමෙන්;

(ඇ) (5) වන අනුඡේදයේ "විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ" යන වචන වෙනුවට, "මණ්ඩලයේ" යන වචනය ආදේශ කිරීමෙන්;

(5) 9 වන ඡේදයේ (i) වන අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(1) නිල බලයෙන් පත්වන සාමාජිකයන්, නම් වශයෙන්:-

(අ) අධ්‍යක්ෂවරයා;

(ආ) අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු;

(ඇ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු;

(ඈ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කලා සහ සංස්කෘතික පීඨයේ පීඨාධිපති;

(ඉ) ආයතනයේ එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානීන්; සහ"

(6) එහි 10 වන ඡේදයේ -

(අ) (1) වන අනුඡේදයේ "විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා" යන වචන වෙනුවට, "අධ්‍යක්ෂවරයා" යන වචනය ආදේශ කිරීමෙන්;

(ආ) (3) වන අනුඡේදයේ "කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ උපකුලපතිවරයා" යන වචන වෙනුවට, "නම් කිරීමේ හෝ පත්කිරීමේ බලධරයා " යන වචන ආදේශ කිරීමෙන්;

(7) එහි 12 වන ඡේදයේ -

(අ) (1) වන අනුඡේදයේ (ආ) අනු-අනුඡේදයේ "එක් එක් අධ්‍යයන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්" යන වචන වෙනුවට "එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානියා" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (1) වන අනුඡේදයේ (ඇ) අනු-අනුඡේදයේ "අධ්‍යයන දෙපාර්තමේන්තුවේ" යන වචන වෙනුවට, "අධ්‍යයන අංශයේ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (1) වන අනුඡේදයේ (ඊ) අනු-අනුඡේදයේ "අධ්‍යයන දෙපාර්තමේන්තුවලින්" යන වචන වෙනුවට, "අධ්‍යයන අංශයෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) (1) වන අනුඡේදයේ (උ) අනු-අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(උ) (ඊ) ඡේදයේ සඳහන් කරන ලද සාමාජිකයන් හැර, ඉගැන්වීමෙහි නිරත ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලය අතරින් තෝරා පත්කරගනු ලබන සාමාජිකයන් දෙදෙනකු; සහ

(ඌ) අවස්ථාවෝචිත පරිදි, ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති හෝ පුස්තකාලයේ ප්‍රධානියා.";

(ඉ) (3) වන අනුඡේදයේ "11 වන ඡේදයේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "10 වන ඡේදයේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්: සහ

(8) එහි 14 වැනි ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"14. (1) (අ) කර්නාටක සංගීතය;

(ආ) නැටුම්, නාට්‍ය සහ නෘත්‍ය කලා;

(ඇ) රූපණ සහ ශිල්පකලා; සහ

(ඈ) තොරතුරු තාක්ෂණය,

පුහුණු කිරීම සම්බන්ධයෙන් අධ්‍යයන අංශ පැවතිය යුතු ය.

(2) එක් එක් අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු විය යුතු අධ්‍යයන අංශ ප්‍රධානියකු සිටිය යුතු අතර ඔවුන් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත මණ්ඩලය විසින් පත්කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යයන අංශයක ප්‍රධානියා ඔහු පත්කරන දිනයේ සිට ගණන් ගැනෙන සේ අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස ඔහු නැවත පත්කිරීම සඳහා සුදුසු විය යුතු ය.

(4) නිවාඩු ගැනීම, රෝගාතුරවීම හෝ වෙනත් හේතුවක් නිසා අධ්‍යයන අංශයක ප්‍රධානියා විසින් මාස තුනකට නොවැඩි කාලයක් සඳහා ස්වකීය ධුරයේ කටයුතු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, ඒ කාලය සඳහා අධ්‍යයන අංශ ප්‍රධානියාගේ තනතුරේ කටයුතු කිරීමට මහාචාර්යවරයකු, සහය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු පත්කරනු ලැබිය යුතු ය. එසේ වුව ද, අධ්‍යයන අංශයක ප්‍රධානියකු විශ්‍රාම ගන්නා විට හෝ ඉල්ලා අස්වන විට හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට නොහැකි වන අවස්ථාවක දී අධ්‍යයන අංශ ප්‍රධානියාගේ තනතුර පුරප්පාඩු වූ ලෙස සැළකිය යුතු අතර (2) වන අනුඡේදයට අනුකූලව අලුත් අධ්‍යයන අංශ ප්‍රධානියකු පත්කරනු ලැබිය යුතු ය.".

EOG 06 - 0125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.